රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 36/2013

මගේ අංකය : EST-4/MINUT/04/3401
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

2013.12.31

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**රාජ්‍ය සේවයේ විශේෂිත තනතුරු සඳහා කණිෂ්ඨ සේවකයින් බඳවාගැනීමේ දී අධ්‍යාපන සුදුසුකම් ලිහිල් කිරීම.**

කිසියම් දෙපාර්තමේන්තුවක සුවිශේෂී කාර්යයක නිරත වන කණිෂ්ඨ කාර්යය මණ්ඩලයේ තනතුරු සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව අනුමත බඳවාගැනීම් පරිපාටිවල අධ්‍යාපන සුදුසුකම් අනුව බඳවාගැනීම අපහසු අවස්ථාවන්හි දී එකී තනතුරුවලට අදාළ අධ්‍යාපන සුදුසුකම් අඩු කර තනතුරු ඇති කළ හැකි බවට අමාත්‍ය මණ්ඩලය තීරණය කර ඇත.

02. ඒ අනුව සුවිශේෂී කාර්යයන්හි යෙදවීම සඳහා දෙපාර්තමේන්තුගත කණිෂ්ඨ සේවක තනතුරු (උදා:- අලි බලන්නා) ඇති කිරීමේ දී දැනට අනුමත කාර්යාල සේවක සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් අධ්‍යාපන සුදුසුකම්වලට වඩා අඩු අධ්‍යාපන සුදුසුකම් සහිතව තනතුරු අනුමත කර ගත හැකි ය.



පී.බී.අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය